බෝමළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය
Tel: +94 025 2222367
**E-mail: mahaviharasl@gmail.com**
**Web: http://www.srimahabodhi.lk**

# 2017
# වප් පොහෝදින
# ධර්ම දේශනා 2



බෝමළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය

# 2017

## ඓතිහාසික අනුරාධපුර මහා විහාරයේ
## වප් පුන් පොහෝ දින සන්නිපාත ශාලාවේ පැවැත්වූ

## "අසාරේ සාර මතිනෝ"

## "සාරඤ්ච සාරතෝඤත්වා" සූත්‍ර ඇසුරින්

## ධර්ම දේශනය


**දේශකයාණෝ**

පූජ්‍ය පාහියංගල සුමංගල හිමි

කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය



බෝ මළුව පන්සල,
මහා විහාරය
අනුරාධපුරය.

Tel: +94 025 2222367
E-mail: mahaviharasl@gmail.com
Web: http://www.srimahabodhi.lk

# පුණ්‍යානුමෝදනාව

පූජ්‍ය පල්ලේගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේ
අටමස්ථානාධිපති

# “අසාරේ සාර මතිනෝ”
# “සාරඤ්ච සාරතෝ ඤත්වා”සූත්‍ර ඇසුරින්
# ධර්ම දේශනය

සාධූ ! සාධූ ! සාධූ !

සඟරුවන නැමදීම....

දේවාරාධනාව....

කාල ඝෝෂණය....

නමස්කාරය සජ්ඣායනය....

අසාරේ සාර මතිනෝ- සාරේවා සාර දස්සිනෝ

තේසාරං නාධි ගච්ඡන්ති - මිච්චා සංකප්ප ගෝචරා

සාරංච සාරතෝ ඤත්වා - අසාරංච අසාරතෝ

තේ සාරං අධි ගච්ඡන්ති - සම්මා සංකප්ප ගෝචරා

විහාරස්ථානයේ වැඩ සිටින නායක මාහිමිපාණන් වහන්සේ ඇතුළු ගෞරවණීය මහා සංඝ රත්නයෙන් අවසරයි.

ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ශ්‍රේෂ්ඨ බෞද්ධ පිංවත්නි, අද මේ පිංවත් පිරිස මේ පොහෝ දිනයේ මෙතෙන්ට එක් රොක් වෙලා සිටින්නේ එදා අප තථාගත අමාමෑණී ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරන්නට යෙදුනා වූ සුවාසූ දහසක් ධර්මස්කන්ධයෙන් දහම් බිඳක් ශ්‍රවණය කිරීමටයි.

මේ ස්ථානයට මෙම පිංවතුන් පිරිස හිමිදිරි පාන්දර පැමිණිලා මූලික වශයෙන් තමන් දෛනිකව සමාදන් වන සිල්පද වලට එහා ගිය අටසිල් සමාදන් වෙලා, සීලමය පිංවතුන් බවට පරිවර්තනය වුණා. අද පෝය දිනය පිළිබඳව දහම් කාරණා සාකච්ඡා කරන්න යෙදෙන්නේ නෑ, මොකද හිමිදිරි පාන්දර ඉඳලා යම් යම් ස්වාමීන් වහන්සේලා පැමිණ මෙම ස්ථානයේ ධර්ම සාකච්ඡා කරන්නට යෙදුනා, එම සාකච්ඡා වලදී අද දිනය පිළිබඳව ඔබට යම් මනා වැටහීමක් ලබා දෙන්නට ඇති.

ඔබ අද සීලමය පිංවතුන් බවට පරිවර්තනය වෙලා ඔබේ සිත, කය, වචනය සංවර කරමින් ඔබ සූදානම් වෙන්නේ ඔබගේ ආධ්‍යාත්මික ජීවිතයට යම් කිසි දෙයක් ඉටු කර ගැනීමටයි.

"සබ්බ දානං ධම්ම දානං ජිනාති"

කියන ආකාරයට සියළුම දානයන් අතරින් උතුම්ම දානය වන ධර්ම දානය සිදුකිරීමටයි අප සූදානම් වන්නේ, ඒක නිසා පිංවත්නි මේ වගේ අවස්ථාවකදී ඔබ සාමාන්‍යයෙන් ඔබේ සිත කය වචනය තිදොර සංවර කරගෙන ධර්මය ශ්‍රවණය කළ යුතුයි. මොකද පිංවත්නි ඔබ මේ කාරණා පිළිබඳ දන්නව, දන්න නිසාම ඔබ මේ කාරණා කඩකරන අවස්ථා අනන්තයි. මම එහෙම දේශනා කළේ ඔබට මා මේ කියන ධර්මය වටහා ගන්නට ලැබෙන්නේ ඔබේ මේ තිදොර සංවර කර ගත්තොත් පමණයි. ඔබ කය වචනය සංවර කර ගනී. නමුත් ඔබේ සිත සංවර කර ගත්තාද කියල අපට පෙනෙන්නේ නෑ. ඒ නිසා පිංවත්නි මන් මේ ධර්මය සාකච්ඡා කරන දේශනා කරන පොඩි වෙලාව හරි ඔබ මේ ධර්මය ඉතාම ඕනෑ කමින් යුක්තව ධර්ම දේශනාව කෙරෙහි සිත යොමු කරගෙන ධර්ම දේශනාව ශ්‍රවණය කළ යුතු වෙනවා. මේ වේලාව කියන්නේ සාමාන්‍යයෙන් ධර්මය

ශ්‍රවණය කිරීමට අපහසු වේලාවක් වනවා ඇති. මොකද ඔබ ආහාර අරගෙන ටිකක් සමහර අයට නිදිමත ගතිය එන්නත් පුළුවන්. ඒ නිසා ඔබ කොහොම හරි මෙම කාල සීමාව තුළ ඉතාමත් ඕනෑකමින් ඔබේ සිත සංසුන් කරගෙන වෙනත් අරමුණු වලට යන්න නොදී ඔබට යම් වෙලාවකදී කල්පනාවට එන්න පුළුවන් තමන්ගේ දූවා දරුවන් පිළිබඳව නැත්නම් දුරබැහැර සිට ආපු අය කොහොමද ගෙවල් දොරවල් වලට යන්නේ. නොයෙක් ආකාරයේ කරුණු කල්පනා කරන්නට පුළුවන්. නමුත් පිංවත්නි ඔබ මේ අවස්ථාවේදී එම සියල්ලක්ම අමතක කරලා මම දේශනා කරන ධර්මය පිළිබඳ ඔබේ සිත යොමු කරලන්න. අපට මෙවැනි අවස්ථාවක් ලැබෙන්නේ ඉතාමත් දුර්ලභව මොකද ඔබ අද වර්තමානයේ මනුෂ්‍යයන් වශයෙන් ඉපදිලා තිබෙනවා. මනුෂ්‍යයන් වශයෙන් ඉපදුණු නිසා ඔබට මේ වගේ අවස්ථාවක් ලැබෙනවා. ඔබ කල්පනා කරන්න එපා මනුෂ්‍යයන් වශයෙන් ඉපදුණු පලියට මේ විදියට ධර්මය අසන්නට ලැබෙනවා කියල. මොකද පිංවත්නි අප දන්නවා බුදුදහම තිබෙන්නේ ලංකාව, ඉන්දියාව, තායිලන්තය, බුරුමය, මියන්මාරය ආදී සීමිත රටවල් ප්‍රමාණයක පමණයි. ඉතිං පිංවත්නි ඒ රටවල් වල ඉපදුනොත් අපිට පුළුවන් ධර්මය අහන්න නමුත් අපි බටහිර රටක ඉපදුනොත් අපිට

භික්ෂූන් වහන්සේ නමක් දකින්න වෙන්නෙත් ඉතාමත් කලාතුරකින්. ධර්මය අහන්න වෙන්නෙ ඉතාමත් කලාතුරකින්. නමුත් පිංවතුනි ඔබ ඒ අතරින් ඉතාමත් වාසනාවන්තයි. මොකද ඔබ තෝරගන තිබෙන්නේ ඓතිහාසික වශයෙන් වටිනා කියන ස්ථානයක්. ක්‍රි.පූ. තුන්වන සියවසේ මිහිඳු මහරහතන් වහන්සේ විසින් ධර්මය ස්ථාපයන කළ දුමින්දාගමනය තුළින් ජය ශ්‍රී මහා බෝධිය රෝපණය කළ ස්ථානයකයි. තමන්ගේ ජීවිතේ ආධ්‍යාත්මික ජීවිතයේ එක්තරා නවාතැන්පොළක මේ විදියට ධර්මය ශ්‍රවණය කරන්න සූදානම් වෙන්නේ ඒ නිසා පිංවත්නි මම ඒ කාරණා පිළිබඳ තවදුරටත් සාකච්ඡා කරන්න යෙදෙන්නේ නෑ.

දුල්ලහංච මනුස්සත්තං - බුද්ධෝප්පාදෝච දුල්ලභෝ

දුල්ලභාවණසම්පත්ති - සද්ධම්මෝ පරම දුල්ලභෝ

ඔබ ඉතාමත් දුර්ලභ කාරණා හතරක් ළඟා කරගෙන තිබෙනවා "දුර්ලභංච මනුස්සත්තම්" මනුෂ්‍ය ආත්මයක් ලබා ගැනීම ඉතාම දුර්ලභයි. ඒ වගේම බුදුරජාණන් වහන්සේ ජීවමාන ලෙස සලකන කාලයක ඉපදීම ඉතාමත් දුර්ලභයි. ක්ෂණ සම්පත්ති ලබා ගැනීමත් ඉතාම දුර්ලභයි. බුදුරජාණන්

වහන්සේ දේශනා කරන ලද ධර්මය පවතින කාලයක ජීවත්වීම ඉතාමත් දුර්ලභයි. පිංවත්නි ඔබ මෙන්න මේ කාරණා හතරම තිබෙන කාලයක තමයි ඉපදිලා තිබෙන්නේ ඔබ ඔබේ ලෞකික ජීවිතය සාර්ථක කරගන්නවා වගේම ඔබට වගකීමක් තිබෙනවා ඔබේ ලෝකෝත්තර ජීවිතයේ නැත්නම් ආධ්‍යාත්මික ජීවිතයත් ඒ ආකාරයෙන්ම සැපවත් කර ගන්නට.

අද මම ධර්ම දේශනාවේ මාතෘකාව වශයෙන් තෝරා ගත්තේ ලෞකික ජීවිතයක් ගතකරමින් ආධ්‍යාත්මික ජීවිතයට යොමු වෙමින් පවතින ඔබට ඉතාමත් වටිනා කියන දහම් ගාථා දෙකක් පිළිබඳවයි. මං මුලින් සඳහන් කළ ගාථාවේ සරල අදහස ඔබට පැහැදිළි කර දෙන්නම් පිංවතුනි.

අසාරේ සාර මතිනෝ - සාරවත් නැති දේ අපි සාරවත් ලෙස කල්පනා කරමින් ග්‍රහණය කර ගන්නවද ඒ වගේම සාරවත් ධර්මය අසාරවත් ලෙස ග්‍රහනය කර ගන්නවාද මිත්‍යා සංකල්පයන්ටම ගෝචර වෙමින් අපි ක්‍රියා කරනවාද ඒ අය කවදාවත් සාරවත් ධර්මයට නොපැමිණෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නට යෙදුනා.

සාරංච සාරතෝ ඤත්වා - සාරවත් වූ දහම් කාරණා සාරවත් ලෙස උපයෝගී කර ගනිමින් අසාරවත් ධර්ම කාරණා ආසාරවත් ලෙස උපයෝගී කරගනිමින් සම්‍යක් කල්පනාවටම ගෝචර වෙමින් යම් කිසි පුද්ගලයෙක් ක්‍රියා කරනවාද ඒ පුද්ගලයා සාරවත් ධර්මයට පැමිණෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නට යෙදුනා. කාටද මේ දහම් කාරණාව දේශනා කලේ? මං හිතන්නේ ඔබට මා මේ දේශනා කරන දහම් කාරණාවේ සරල අදහස තේරෙන්නට ඇති. මොකද පිංවත්නි සමාජයේ තිබෙනවා යහපත් හා අයහපත් කියල දෙකොට්ඨාශයක්. ඔබට යහපත් දේ හා අයහපත් දේ තෝරා ගන්නට පුළුවන්. මෙහිදී යහපත් දෙය කෙරෙහි සිත යොමු කර ගනිමින් ඒ ඔස්සේ ක්‍රියා කරනවානම් එම පුද්ගලයාට යහපතක්ම සිදුවෙනවා. මේ ධර්ම දේශනාවේ අවසානයේදී ඔබට තේරේවි මෙම ධර්ම දේශනාවේ සරල අදහස හා එයින් ලැබෙන ප්‍රතිඵල මොනවාද කියා.

පිංවත්නි මෙම ධර්ම පදයේ දහම් ගාථාව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සාරිපුත්ත තෙරුන් වහන්සේගේ චිත්තප්‍රමෝදය හේතු කොටගෙනයි. අපි දන්නවා

බුදුරජාණන් වහන්සේට අගසව් දෙනමක් හිටියා සාරිපුත්ත තෙරුන් වහන්සේ හා මුගලන් තෙරුන් වහන්සේ.මෙම තෙරුන් වහන්සේලා දෙනම ඒකා සංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර අනෝමදස්සි බුදුරජාණන් වහන්සේගේ කාලයේ බ්‍රාහ්මණ වංශිකයෙක් හා ගෘහපති වංශිකයෙක් විදියට උපදිනවා.

බ්‍රාහ්මණ වංශිකයා සරද මානවකයා ලෙසත් ගෘහපති වංශිකයා සිරිවර්ධන මානවකයා ලෙසත් හඳුන්වනවා.

මෙම සරද මානවකයා ඉතාමත් බුද්ධිමත් වගේම ත්‍රිවේදය ගැන මනා දැනුමක් තිබුණා. මෙලෙස ගිහි ජීවිතය ගත කරද්දී ඔහුට ගිහි ජීවිතයේ නිස්සාර බව නිසරු බව තේරෙනවා. මෙලෙස තේරුනාට පසුව ඔහු කල්පනා කරනවා අපි මැරි මැරී ඉපදෙනවා වයසට යනවා ලෙඩ වෙනවා රෝගයට පත් වෙනවා අපිට නිත්‍ය සුවයක් ලැබෙන්නේ නැහැ මෙලෙස ජීවත් වුනොත්. මෙලෙස කල්පනා කර පිංවත්නි ඔහු ගිහි ජීවිතය අතහැර තවුස් දම් පිරීමට වනයට යනවා. ඔහු මෙලෙස තවුස්දම් පුරමින් සිටිද්දී පිංවත්නි ඔහුගේ ශ්‍රාවක පිරිස ගෝලබාල පිරිස 74000 ක් බවට පත් වෙනවා. මෙතුමාට පිංවත්නි ත්‍රිවේදය පිළිබඳ

හොද දැනුමක් තිබුණා. බුද්ධ රත්නය පිළිබඳ හොඳ දැනුමක් තිබුණා. මෙලෙස පරිපූර්ණ වූ පුද්ගලයෙක්.

අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ දවසක් හිමිදිරි පාන්දර දිවසින් බලන විට දකිනවා සරද මානවකයා. එවිට අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ කල්පනා කරනවා මට මෙම ස්ථානයට යන්නට පුළුවන් වුනොත් හැත්තෑ හතර දහසක් පිරිස උතුම් රහත් භාවයට පත් වෙනවා කියල. මෙලෙස සිතන බුදුරජාණන් වහන්සේ සරද මානවකයා සිටින ආශ්‍රමයට වඩිනවා. දුරදිග සිටම සරද මානවකයා බුදුරජාණන් වහන්සේ දකිනවා. දැක්කයින් පසුව ඔහුට කල්පනා වෙනවා මේ නම් එසේ මෙසේ පුද්ගලයෙක් නෙමෙයි දසබලදාරී සිව්පිළිසිඹියා බුදුන් වහන්සේ කෙනෙක් කියලා. බුදු කෙනෙක් ඉපදෙන විටදී ඊට අවුරුදු 500ක 1000ක සිට බුදු ගුණ පිළිබඳව සමාජය කතිකා වෙනවා. ඉතිං පිංවතුනි මෙම සරද මානවකයාටත් බුදුන් වහන්සේගේ චරිත ලක්ෂණ ගමන් විලාශය පිළිබඳ දැනුමක් තිබුණා. ඉන්පසුව මොහු ඉක්මනින් බුදුරජාණන් වහන්සේ ලගට ගිහින් දණ්ඩ නමස්කාරය කරලා හත්වරක් වැඳලා උන්වහන්සේට ආසන පිළිගන්වලා උන්වහන්සේ සමඟ කතා බහ කලා. මේ අවස්ථාවේදි තමාගේ ශ්‍රාවක පිරිස

වනයට ගිහින් හිටියේ පළතුරු නෙළාගෙන ඒම සඳහා. මෙම අවස්ථාවේ 74000 ක් ශ්‍රාවක පිරිස මෙම ස්ථානයට පැමිණෙනවා. මෙලෙස පැමිණුනාට පස්සේ සරද මානවකයා බුදුරජාණන් වහන්සේ හඳුන්වා දී ගුණ කියා ඔබ ඔය ගෙන එන ලද පළතුරු බුදුරජාණන් වහන්සේට පූජා කරන්න යැයි පවසනවා. ඊට පසුව බුදුරජාණන් වහන්සේ එම අවස්ථාවේ දන් වළදා අවසානයේ උන්වහන්සේගේ අධිෂ්ඨානයෙන් එම ස්ථානයට ලක්ෂයක් මහරහතන් වහන්සේලා පැමිණෙනවා. මෙයින් එතැන හිටපු පිරිස ඉතාමත් පුදුමයට පත් වෙනවා. සරද මානවකයා තම ගෝල බාල පිරිසට ඉක්මනින් කැලයට ගොස් මල් නෙළාගෙන එන්නැයි පවසනවා. මෙම සියලු දෙනාම ධ්‍යාන මාර්ග වලට එළඹිලා තිබුණේ. මෙම නිසා ඔවුන් සියලු දෙනාම සෘද්ධියෙන් වනයට ගොස් අවශ්‍ය මල් සහ ආසන පිළිගැන්වීමට අවශ්‍ය කළමනා ද්‍රව්‍ය අරගෙන පැමිණ බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ කර ගත් රහතන් වහන්සේට ආසන පිළියෙල කරනවා. මෙම පිරිසට දින 7 ක් නිරෝධ සමාපත්තියෙන් වැඩ සිටින්න කියලා බුදුරජාණන් වහන්සේ ආරාධනා කරනවා. මෙම මහරහතන් වහන්සේලා දින 7 ක් නිරෝධ සමාපත්තියෙන් වැඩ සිටිනවා. සරද මානවකයා මල් කුඩයක් විහිදුවාගෙන බුදුරජාණන් වහන්සේ සමීපයට වී

ඉන්නවා. සරද මානවකයාගේ ගෝල බාල පිරිස මාරුවෙන් මාරුවට ආහාර ගෙන එමින් අර භික්ෂුණ් වහන්සේලාට ඇප උපස්ථාන කරමින් සිටිනවා. දින 7 නිමා වූ පසු, බුදුරජාණන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගී සිට රැස්ව සිටි පිරිසට ධර්මය දේශනා කරනවා. ධර්ම දේශනාව අවසානයේ සරද මානවකයා හැර ඉතිරි 74000 ක් පිරිස උතුම් වූ රහත් භාවය ලබා ගන්නවා. මෙන්න මේ අවස්ථාවේ පිංවතුනි, තමන් ආසන්නයේ සිටි මිසදිටු නම් අගසව් රහතන් වහන්සේ නමකට බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන්නැයි ආරාධනා කරනවා. උන්වහන්සේ ධර්මය දේශනා කරනවා. එම ධර්ම දේශනාව අසා සිටි සරද මානවකයා කල්පනා කරනවා අනේ, මුන් වහන්සේගේ ධර්ම දේශනා රටාව කෙතරම් මිහිරිද, ලස්සනට ධර්මය දේශනා කළාද, මටත් පුළුවන් නම් යම් බුදුරජාණන් වහන්සේ නමකගේ සමයක ධර්ම සේනාධිනායක වශයෙන් අගසව් නමක් වෙන්නට කියා. අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ මෙම සිතුවිලි දැක උන්වහන්සේ නියත විවරණ දෙනවා අදින් වසර ඒකා සංඛ්‍ය කල්ප ලක්ෂයකට පසුව උපදින සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාල සමයේදීඋපතිස්ස නමින් ඉපිද, සැරියුත් නමින් පැවිදි වී

ප්‍රඥාවන්තයන් අතුරින් අග තනතුරු ලබා, ධර්මයේ සේනාධිනායක වශයෙන් තනතුරු ලබන බවට.

මෙම සරද මානවකයාගේ හොදම යාලුමිත්‍රයා උනේ සිරිවර්ධන අපගේ බුද්ධ ශාසනයේ හිටපු මුගලන් තෙරුන් වහන්සේයි. මෙම සිරිවර්ධන මානවකයා ඉතාම ප්‍රසිද්ධ වෙළෙන්දෙක්, සිටුවරයෙක් විදියට සිටියේ. සරද මානවකයා කල්පනා කරනවා මම ශාසනයේ අගසව් උනොත් එයට තව කෙනෙකු අවශ්‍යයි. මෙම කාරණාව සිරිවර්ධනට දැන්වුවහොත් ඔහු එය ඉතා සතුටින් බාර ගනී. ඒ සඳහා පෙරුම් පුරයි කියලා සිරිවර්ධන මානවකයා හමුවේ මෙම කාරණාව සැල කරනවා. ඉතිං පිංවතුනි සිරිවර්ධන මානවකයාත් මෙම කාරණාවට සතුටු වෙලා අසනවා කොහේද මේ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ වැඩ සිටින්නේ කියා. ඉන් පසුව අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් උන් වහන්සේ ඇතුළු ලක්ෂයක් මහ රහතන් වහන්සේලා තම නිවසට වැඩමවා දින 7 ක් තිස්සේ චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍යයෙන් ලබන සිව්පස දානයෙන් ඇප උපස්ථාන කරනවා.

දින 7 අවසානයේ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ සිරිවර්ධන උපාසකයාගේ කරුණු කාරණා දැන ඔහුටත් නියත විවරණ ලබා දෙනවා මෙන්න මේ ලෙස වසර ඒකා සංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර වර්තමානයේ ඉපදී සිටිය උපතිස්ස, කෝලිත නැත්නම් සිරිවර්ධන හා සරද දෙදෙනාට නියත විවරණ ලබා දෙනවා. ඔවුන් ඒකා සංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරමින් පැමිණ මෙම ගෞතම බුදුන් පහල වූ කල්පයේ නාලක සහ උපතිස්ස ග්‍රාමයේ කෝලිත, උපතිස්ස නමින් එකම අවස්ථාවේ පටිසන්ධි ලබා ගන්නවා.

ඒ වගේම පිංවත්නි ඉපදීම, නම්තැබීම සිදු වන්නේ එකම අවස්ථාවක. මෙම උපතිස්ස කෝලිත මානවකයින් දෙදෙනා ඉපදෙද්දී 250 ක් පිරිස එම දිනයේ ඉපදුණු බවට පොතපතේ සඳහන් වෙනවා. මෙම දෙදෙනා වැඩිවියට පැමිණුනු පසු මොවුන් දෙදෙනාගේ පුරුද්දක් තිබුණා වාර්ෂිකව පැවැත්වෙන ගිරාග සමජ්ජ කියන නාට්‍ය බලන්න යන්න. මෙම නාට්‍ය ඉන්දියාවේ තිබිච්ච ඉතාමත් ප්‍රසිද්ධ නාට්‍යයක්. එම නාට්‍යයේදී නළු නිළියන් එකතු වී විවිධ නාට්‍ය රඟ දක්වනවා. කෑමෙන් බීමෙන් අංග සම්පූර්ණයි. නාට්‍ය අවසානයේදී තෑගි බෝග ලබා දෙනවා. මේ ආකාරයට ඉතාමත් විනෝදයෙන් ජීවත් වෙන්න පුළුවන්

කාලපරිච්ඡේදයක්. ඉතිං පිංවත්නි මෙම කෝලිත උපතිස්ස දෙදෙනාම පුරුදුවෙලා සිටියා වසරකට සැරයක් පැවැත්වෙන මෙම නාට්‍යයට සහභාගී වෙන්නට.

මෙම නාට්‍ය නරඹන එක් අවස්ථාවකදී මොවුන් දෙදෙනාට කල්පනා වෙනවා මෙහි කිසිම සරුබවක් නැහැ කියලා. මොකද පිංවත්නි මෙම නාට්‍යයට සම්බන්ධ වී සිටින පිරිස තව අවුරුදු කිහිපයක් ගිය විට වයසට යනවා, හම රැලි වැටෙනවා, කෙස් ඉදෙනවා, දත් ටික හැලෙනවා, ඇඟ වාරු නැති වෙනවා. මේ විදියට මෙම කාරණා පිළිබඳව උපතිස්ස හා කෝලිත දෙදෙනාටම කල්පනා වෙනවා මෙහි ඉතාම නිත්‍ය සැපයක් නෑ කියලා. පසුව දෙදෙනාම කල්පනා කරනවා මේ සඳහා යම් කිසි නිත්‍ය පිළිතුරක් ඇති. ඒ පිළිතුර සෙවීම සඳහා අපි ගවේශන කටයුතු කරන්න ඕනි කියලා. මෙම සිතිවිල්ල දෙදෙනාටම එකම අවස්ථාවකයි සිතෙන්නේ. ඉන් පසුව මෙම දෙපළ ගෙවල් වලට ගොස් දෙමාපියන්ට මෙම කාරණා පවසලා 250 ක් පිරිස සමඟ ධර්මය සොයාගෙන යනවා. ඒ කාලයේ ප්‍රසිද්ධ සුප්පිය කියා පරිබ්‍රාජකවරයෙක් හිටියා. ඔහුව අප හඳුන්වනවා සංජය කියලා. ගියාට පස්සේ පිංවත්නි ඔහු ගාව යම් කාල පරිච්ඡේදයක් ඉන්නවා. පසුව මොවුන් දෙදෙනා තේරුම්

ගන්නවා මොහු ගාවත් ධර්මයක් නෑ මොහු බොරු කියමින් අන්‍ය පුද්ගලයින් මුලා කරමින් ජීවත් වන පුද්ගලයෙක්. අපි මෙතැන සිටියොත් අපිත් මෝඩයින් බවට පත් වෙනවා කියා මොවුන් දෙදෙනා එළියට බහිනවා. එළියට බැහැල දෙදෙනා කථිකා කර ගන්නවා අපි දෙදෙනා මාර්ග 2 ක යමු. යම් කිසි පුද්ගලයෙක්ට මුලින් ධර්මය හමුවුනොත් නිවැරදි පුද්ගලයෙක් හමුවුනොත් එය අනෙකාට දැන්විය යුතුයි කියා, උපතිස්ස කෝලිත දෙදෙනා මාර්ග 2 ක යනවා.

මෙම උපතිස්ස බ්‍රාහ්මණයා වීදියේ ගමන් කරන විට දකිනවා බොහොම ශාන්තව ගමන් කරන හාමුරුනමක්. ඒ තමයි පිංවත්නි පස්වග මහණුන්ගෙන් අවසන් මහරහතන් වහන්සේ වූ අස්සජි මහරහතන් වහන්සේ. උන්වහන්සේ දැක්කට පසු උපතිස්ස බ්‍රාහ්මණයා සිතනවා පුදුම ශාන්තභාවයක් තිබෙන්නේ උන්වහන්සේගේ ගමන් විලාශයේත්, ඉඳුරන්ගේත්. එම නිසා මොහු කල්පනා කරනවා මෙම ශ්‍රමණයානන් වහන්සේ ලඟ යම් කිසි දහම් කාරණාවක් ඇතියි කියා. මේ වෙලාවේ අස්සජි මහ රහතන් වහන්සේ පින්ඩපාතයේ වැඩම කරමිනුයි සිටියේ. තම පින්ඩපාතය වැළඳීම සඳහා ගසක් මුලට වැඩම කරනවා. එවිට මෙම උපතිස්ස මානවකයාද අස්සජි මහ රහතන්

වහන්සේ අසළට ගොස් පැන් පිළිගන්වා උන්වහන්සේ දානය වළඳන අවස්ථාවේ පවන් සලමින් සිට පාත්‍රය සෝදා දී අවශ්‍ය කරන සියලු පහසුකම් ලබා දෙනවා. නමුත් මෙම රහතන් වහන්සේ කිසිදු කතාවක් නෑ. පසුව මෙම උපතිස්ස මානවකයා අස්සජි මහරහතන් වහන්සේගෙන් අහනවා,

"ස්වාමීනි අවසරයි ඔබ වහන්සේගේ ශාස්තෘන් වහන්සේ කවුද?" කියලා.

"ඔබ වහන්සේ අනුගමනය කරන්නේ කාගේ ධර්මයක්ද ?" කියලා.

ඉන් පසු අස්සජි මහරහතන් වහන්සේ කල්පනා කරනවා පරිබ්‍රාජකයෝ හරිම කරදරයි. ඔවුන් අපේ ධර්මය විවේචනය කරමින් ඇවිදින පිරිසක්. ඒ නිසා වැඩි කතාවක් නැතුව ඉන්න ඕන යයි සිතා,

"මාගේ ශාස්තෘන් වහන්සේ ගෞතම බුදුරජාණන් වහන්සේ. මම උන්වහන්සේගේ ධර්මය අනුගමනය කරන්නේ" යැයි වදාරනවා.

පසුව උපතිස්ස මානවකයා කියනවා,

“අනේ ස්වාමීනි කලබල වෙන්ට එපා. මට දහම් කරුණු කීපයක් දේශනා කරන්ට කියලා.”

අස්සජි මහරහතන් වහන්සේ “මම වැඩි ධර්මයක් දන්නේ නෑ. මම බොහොම පුංචි ධර්මයක් දන්නේ” යැයි වදාරනවා.

“කමක් නෑ ස්වාමීනි ඔබ දන්න ධර්මය කෙටියෙන් දේශනා කරන්නැයි” උපතිස්ස මානවකයා පවසනවා.

මෙන්න මේ අවස්ථාවේ අස්සජි මහරහතන් වහන්සේ චතුරාර්ය සත්‍ය අඩංගු ප්‍රතිසංයුක්ත ගාථාව දේශනා කරනවා.

“යේ ධම්මා හේතුප්පභවා -තේසං හේතුං තථාගතෝ ආහ

තේසංච යෝ නිරෝධෝ -ඒවං වාදී මහා සමණෝ”

ඒවං වාධි මහා සමණෝ : ඒ ශ්‍රමණ භගවත් ගෞතමයාණන් වහන්සේ මෙසේ දේශනා කළා.

යෙ ධම්මා හේතුප්පභවා : යම් හේතුවකින් හට ගන්නා ධර්මයක් ඇද්ද යම් ඵලයකින් හට ගන්නා හේතුවක් ඇද්ද

තේසංචයෝ නිරෝධෝ : යම් ඵලයකින් හට ගන්නා නිරෝධයක් ඇද්ද මෙන්න මේ චතුරාර්ය සත්‍ය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන්නට යෙදුණා, කියා දේශනා කළ සේක.

මෙලෙස බුදුරජාණන් වහන්සේ පිළිබඳවත් උන්වහන්සේගේ ධර්මස්කන්ධය පිළිබඳවත් සඳහන් වෙනවා. මෙම ගාථාවේ පද දෙකක් අසන විටම උතුම් උපතිස්ස පරිබ්‍රාජකයා උතුම් සෝවාන් තත්වයට පත් වෙනවා පිංවතුනි. සෝවාන් ඵලයට පත් වුනායින් පස්සේ මෙම කාරණාව තම යාළුවාට සඳහන් කරලා දෙදෙනාත් එක්කම බුදුරජාණන් වහන්සේ සොයාගෙන ජේතවනාරාමයට ගමන් කරනවා. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඈත තියා දකිනවා මේ දෙදෙනා එනවා. උන් වහන්සේ ධර්මය දේශනා කරමිනුයි සිටියේ. එම අවස්ථාවේ ධර්මය අසා සිටින පිරිසට දේශනා කරනවා.

" අර ඈතින් එන්නේ මාගේ මේ ශාසනයේ අගසව් දෙනමයි" කියලා.

මෙම කෝලිත උපතිස්ස දෙදෙනා තම 250 ක් පිරිස සමඟ බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණෙනවා. ඉන් පසුව බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරනවා. දේශනාව අවසානයේ 250 ක් පිරිස උතුම් වූ රහත් බාවය ලබා ගන්නවා. ඊට දින 8 කට පස්සේ මුගලන් තෙරුන් වහන්සේ රහත් භාවයට පත් වෙනවා. ඊට දින 15 කට පස්සේ දීඝජන

කියලා බ්‍රාහ්මණයින්ට දේශනා කරන ධර්මය අසා උපතිස්ස මානවකයාද උතුම් වූ රහත් ඵලය ලබා ගන්නවා. ඒහි භික්ඛු භාවයෙන් උපසම්පදාව ලබාගෙන සැරියුත් මහරහතන් වහන්සේ නමින් ශාසනයේ වැඩ සිටිනවා පිංවත්නි.

මෙම සැරියුත් මුගලන් තෙරුන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ අභිමුවට වැඩම කර තමන් ධර්මය සොයා ගත් ආකාරය පවසා සිටිනවා. මේ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ සැරියුත් මහ රහතන් වහන්සේ ශාසනයේ ප්‍රඥාවන්තයන් අතුරින් අග තැන්පත් තනතුර ලබා දෙනවා. ඒ වගේම මුගලන් මහරහතන් වහන්සේට සෘද්ධිමතුන් අතරින් අග තනතුර ලබා දෙනවා. " ඒත දග්ගං භික්ඛවේ මම සාවකානං මහා පඤ්ඤාවන්නානන් සාරිපුත්තෝ" වශයෙන් හා " ඒත දග්ගං භික්ඛවේ මම සාවකානං මොග්ගල්ලානං යධිදං ඉදම්මතෝනම්" වශයෙන් ඒ රහතන් වහන්සේලාට පිංවත් අගසව් තනතුරු ලබා දෙනවා. පිංවත් සැරියුත් තෙරුන් වහන්සේ තමන් ධර්මය සොයා ගත් ආකාරය බුදුරජාණන් වහන්සේට කියන අවස්ථාවේ සැරියුත් තෙරුන් වහන්සේ ප්‍රකාශ කරනවා තමන් මුලින්ම සංජය කියන පරිබ්‍රාජිකයා ළඟ සිටියේ ධර්මය ඉගෙන ගනිමින් නමුත් එතන සරු ධර්මය තිබුන්නෑ. ඉතිං මම ධර්මය

සොයාගෙන ගිහිල්ලා අස්සජි මහරහතන් වහන්සේගෙන් ධර්මය අහල ඔබ වහන්සේ කරා පැමිණියේ. මම මීට පෙර මෙම ධර්මය සොයාගත් බව සංජය පරිබ්‍රාජකවරයාට මෙය දැන්වුවා. නමුත් සංජය පරිබ්‍රාජකයා ප්‍රකාශ කර සිටියේ තමන් ගුරුවරයෙක්ව සිටියදී ඔහුට තවත් ශාස්තෘන් වහන්සේ නමක් ලග ශිෂ්‍යයෙක් වන්නට බැහැ. මේ ලෝකයේ වැඩිපුර ඉන්නේ බුද්ධිමතුන් නොව මෝඩයින් මම ඒ මෝඩ පිරිසට ශාස්තෘන් වෙමින් ධර්ම කාරණා කියා දෙමින් ඉන්නවා කියලා ඔහු ප්‍රතික්ෂේප කරනවා බුදුරජාණන් වහන්සේ සමීපයට ඒමට.

බුදුරජාණන් වහන්සේ මෙම කාරණාව ශ්‍රවණය කර මෙම අවස්ථාවේදී තමයි "අසාරේ සාර මතිනෝ" යන ගාථාව දේශනා කරන්නේ. පිංවත්නි අපට මේ කතාවෙන් ගන්න ලොකු ආදර්ශයක් තිබෙනවා. මේ ලෝකය තුළ පවතිනවා සරු සහ නිසරු කියලා දෙකොට්ඨාශයක්. අපි ලෞකික ජීවිතයක් ගත කරන පුද්ගලයන් වශයෙන් අප නිරන්තරයෙන් අවධානය යොමු කරන්නේ අපේ ඇස, කන, දිව, ශරීරය පිනවන කාරණා කෙරෙහි. අප ඉතාමත් කලාතුරකින් තමා පිංවතුනි අධ්‍යාත්මය සරු කරන දහම් කාරණා වලට එළඹෙන්නේ. උදාහරණයක් විදියට ගත්තොත්

පිංවතුනි අද පෝය දවස මෙම ස්ථානයේ නම් බොහෝ පිරිසක් පැමිණ සිටිනවා ධර්මය ශ්‍රවණය කිරීම සඳහා.

නමුත් ලංකාවේ පන්සල් දහස් ගාණක් තියනවා ඒ හැම පන්සලකම ප්‍රතිශතයක් ලෙස ගත්තොත් ගොඩක්ම මේ විදියට බණ අහන්න ඇවිත් සිටින්නේ සාමාන්‍යයෙන් අවුරුදු 45-50 පැනපු උපාසක අම්මලා නැත්නම් තාත්තල කුඩා දරුවෝ යෞවන පිරිස් පැමිණ සිටින්නේ ඉතාමත් පොඩි ප්‍රතිශතයක්. අපේ ජීවිතයේ ඇති අසාරවත් බව හා අපේ මේ නිකරුනේ ජීවත් වීමේ තේරුමක් නොමැති බව තේරුම් ගන්නේ ඉතාමත් සීමිත පිරිසක්. අපිට ඒ දේ තේරෙන්නෑ කුඩා කාලයේදී, අපට ඒ දේ තේරෙන්නෑ යෞවන වයසේදී. ඒත් පිංවතුනි අපේ කොණ්ඩය ඉදෙන කොට අපේ හම රැලි වැටෙන කොට දත් ටික හැලෙන කොට අතපය වාරු නැති වෙනකොට ලෙඩක් රෝගයක් හැදිල ඉස්පිරිතාලෙ ඉන්නකොට අපිට තේරෙනවා මේ මිනිසත් බවේ ඉපිද ඉපිද ජීවත් වීමේ පල විපාක සම්බන්ධව. බලන්න පිංවතුනි ඒක හොදට තේරෙනවා. ඔබට රෝග පීඩාදියක් හැදිලා ඉස්පිරිතාලේ ඉන්න කාලයක ඔබට ඒ පිළිබඳව හොඳට තේරෙන්න ඇති. අපිට භයානක රෝගයක් හැදිලා අපි එයින් පීඩා විදිනකොටත් අපිට ඒ කාරණාව පිළිබඳ

තේරෙනවා. එතකොට තමා බහුතරයක් ධර්මය කෙරෙහි යොමු වන්නේ. එතකොට තමා අපට මේ ජීවිතයේ තියන අනිත්‍ය බව තේරෙන්නේ. ඒ නිසා පිංවත් අපි නිරන්තරයෙන් උත්සහ ගන්න ඕන සමාජයේ තියන හොද නරක නිරන්තරයෙන් තේරුම් අරගෙන හොද කියන සංකල්පය පමණක් ප්‍රගුණ කරන්න. මොකද පිංවතුනි බුදුරජාණන් වහන්සේ මහාසාධුපම කියන සූත්‍රයෙන් දේශනා කරනවා මේ සරු කාරණා පිළිබඳව හොද උපමා කතාවක්. යම්කිසි පුද්ගලයෙක් සරු දේවල් විදියට ගන්නේ මොනවාද තමන්ට යාන වාහන තියනවා, අතට පයට සේවක සේවිකාවන් සිටිනවා, ගෙවල් දොරවල් තියනවා, ඉඩකඩම් තිබෙනවා කෑමට බීමට ඕන තරම් දේවල් තියනවා මේක පිංවතුනි පොදුවේ හාමුදුරුවෝ වේවා ගිහි බෞද්ධයන් වේවා පොදුවේ සමානව ඉතිං මේවා ලැබෙන කොට අපි ඉතාමත් සතුටු වෙනවා. සතුටු වෙනකොට ඔවුන් කල්පනා කරනවා අපි තමයි සමාජ තලයේ ඉන්න ඉහලම පිරිස කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මෙම පුද්ගලයින් ගහක අරටුව කඩාගෙන යනවා වෙනුවට ගහේ කොළ අතු මල් කඩාගෙන යාමක් විදියට සලකන්න පුළුවන් කියලා. මන්ද යත් අපට අවශ්‍ය අරටුව. නමුත් අපි

කඩාගෙන යන්නේ ගහේ තියන කොළ අතු මල් ඒ කියන්නෙ ඒක නිශ්ඵල ක්‍රියාවක්.

ඒ වගේම තවත් පිරිසක් ඉන්නවා සීලය හොඳින් ආරක්ෂා කරනවා පන්සිල් පද පහ රකිනවා අට සිල් ආරක්ෂා කරනවා. මේ පුද්ගලයින් හිතනවා මම තමයි මේ සමාජ තලයේ ඉන්න ඉහළම පුද්ගලයෝ මොකද මම අර කියන ලෞකික දේවල් වලින් තෘප්තිමත් වෙන්නෙ නැතුව මෙම සිල්පද ආරක්ෂා කරමින් ඉන්නවා. පිංවතුනි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා එම පුද්ගලයා ගහක තියන අරටුව වෙනුවට වේලිච්ච පොතු කඩාගෙන යාමක් විදියට. ඒ වගේම පිංවතුනි තවත් පුද්ගලයෙක් ඉන්නවා එතුමා තමාට ලැබෙන ලෞකික දේවල් වලින් සෑහීමකට පත් වන්නේ නෑ. සීලයන් ආරක්ෂා කිරීමෙන් සෑහීමකට පත් වන්නේ නෑ. ඔහු අෂ්ට සමාපත්තිය ආරක්ෂා කරමින් ජීවිකාව ගත කරනවා. බුදුරජාණන් වහන්සේ මෙම පුද්ගලයා අර ගහේ අරටුව කඩාගෙන යාම වෙනුවට ගහේ ඇතුල් පොත්ත කඩාගෙන යන පුද්ගලයෙකු ලෙස හඳුන්වනවා.

ඒ වගේම පිංවත්නි තවත් පුද්ගලයෙක් ඉන්නවා ඉහත සඳහන් කළ තුනෙන්ම සෑහීමකට පත් නොවී ෂඩ් අභිඥාවන්ට යොමු වෙලා ඒවා ආරක්ෂා කරමින් ජීවත් වෙනවා. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දේශනා

කරනවා එම පුද්ගලයා ගඟේ තියන අරටුව කඩාගන යනවා වෙනුවට මදය කඩාගෙන යාමක් විදියට සලකනවා.

ඉන්පසු පිංවත්නි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අවසාන පුද්ගලයා අර සඳහන් කළ කරුණු කාරණා සියල්ලෙන්ම සෑහීමකට පත් නොවී චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගනිමින් උතුම් වූ නිර්වාණ ශක්තිය ලගා කර ගැනීම සඳහා අවශ්‍ය කරන පසුබිම සකසා ගනිමින් උතුම් වූ රහත් භාවයට පත්වෙනවා. මෙන්න මේ පුද්ගලයා තමයි පිංවත්නි ගඟේ තියන අරටුව කඩාගෙන යන්නේ. ඉතිං පිංවත්නි බලන්න අපට ඒ අවස්ථාවේදී සරු සහ නිසරු කාරණා පිළිබඳ හොද මනා වැටහීමක් ලැබෙනවා. මොකද යම් පුද්ගලයෙක් හිතනවානම් සීලය ආරක්ෂා කරමින් ඒ තමයි සරු දේ කියලා සලකලා ජීවත් වෙනවා නම් අනුන් පහත් කරමින් සලකමින් මීට වඩා උතුම් කාරණයක් නැහැයි කියලා, පිංවතුනි ඒක ගැලපෙන්නේ නෑ. ඒ නිසා පිංවත්නි අපි මේ දහම් කාරණා සියල්ලක්ම සම්පූර්ණ කරමින් ඕන ජීවත් වෙන්න. මොකද අපේ පිංවතුන් සෑම පෝයකටම ධර්මය ශ්‍රවණය කරමින් සෑම පෝයකටම පන්සලට යමින් එමින් දාන සීල භාවනා කියන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා සිදු කරමින් ඉන්න පිරිසක්. ඔබම තමයි මේ සරු සහ නිසරු දේ තෝර ගන්න බැරුව වැරදි මාවතේ ගමන් කරන්නේ. අපි

දන්නවා මෑත කාලයේ මේ වසර 50 ක කාලයක කතිකාවතක් ගොඩ නැගිල තිබුණ බුදුරජාණන් වහන්සේ ඉපදුණේ ලංකාවේ කියා. බුදුරජාණන් වහන්සේ ඉපදුණේ ඉන්දියාවේ කියා කිසිදු සැකයක් නැහැ. එම කාරණා තහවුරු විමට ඕන තරම් සාධක අප සතුව තිබෙනවා. ඉතිං පිංවත්නි යම්කිසි පිරිසක් බුදුරජාණන් වහන්සේ ඉපදුණේ ලංකාවේ හිරිවටුන්නේ ඒ වගේම තෙල්දෙණියේ උන්වහන්සේ බුදු වුණේ. ඒ වගේම ජේතවනාරාමය තිබුණෙ රිටිගල යනාදී දේ ප්‍රකාශ කරමින් සිටියා. මේ කරුණු කාරණා විශ්වාස කරන පිරිසක් ලංකාවේ සිටියා. ඒ ස්ථාන වලට යනවා ඒ ස්ථාන වැඳ පුදා නමස්කාර කරනවා. ඉතිං පිංවත්නි මං කියන්න උත්සහ කළේ අපේ මේ බෞද්ධ පිරිසමනේ, අන්‍යාගමික පිංවතුන් මේ ස්ථාන වලට යන්නෙ නැනේ බලන්න පිංවතුනි මේ අයට සාරවත් දහම් කාරණා කියන්නේ, නිසරු දහම් කාරණා කියන්නෙ මොකක්ද කියලා අවබෝධයක් නැතිව ගියා.

ඒ නිසා අපි දෙයක් අහද්දි අපිට තියනවා බුද්ධියක් අපි ඒකෙන් දෙපාරක් කල්පනා කරන්න ඕනි. බුදුහාමුදුරුවො වුනත් යමක් කියද්දි උන්වහන්සේ විසින් දේශනා කරන කරුණු කාරණා වුණත් ඉතාමත් බුද්ධියෙන් යුක්තව

දෙපාරක් හිතලා කල්පනා කරලා එය වටහාගෙන ඊට අනුව ජීවත් වෙන්න කියල තමයි දේශනා කරල තියෙන්නේ. සමාජයේ මේ ආකාරයට අපේ උපාසක අම්මලා උපාසක තාත්තලා යෞවන පිරිස් නොමඟ යන අවස්ථා අනන්තවත් තියනවා.

මොකද, පිංවත්නි ඔබ දකිනා රූපවාහිනී යන්ත්‍රයක් බලන අවස්ථාවේදී දකිනවා විවිධ කෑම වර්ග ඇඳුම් වර්ග ඔබේ ආලින්දයට ගෙන එනවා. මේ අවස්ථාවන්හිදී ඔබ තමන්ගේ දුවා දරුවන්ට යහළු මිත්‍රාදීන්ට ස්වාමි දියණියට භාර්යාවට තමන්ට ගැළපෙනවද නොගැළපෙනවද නොබලා ඒවා ලබා දීමක් සිදු කරනවා. අපි කල්පනා කරන්න ඕන අපට ගැළපෙන ඇඳුම් පැළඳුම් අප ලෙඩ නොවන ආහාර වර්ග මොනවාද? සමාජයේ තියන යහපත් කරුණු මොනවාද කියල අවබෝධයෙන් යුක්තව සාරවත් කරුණු කාරණා පමණක් ඔබේ ජීවිතයට එක් කර ගන්න ඕන.

මම කල්පනා කරනවා මේ මොහොත වන විට සාරවත් සහ අසාරවත් යන කරුණු කාරණා පිළිබඳව මනා වැටහීමක් ලැබෙන්නට ඇති කියල. ඔබ පන්සිල් පද පහ ආරක්ෂා කිරීමත් සාරවත් ධර්ම කාරණාවක් විදියට සලකන්නේ.

පිංවත්නි පින පව පිළිබඳ ඔබට මනා වැටහීමක් තියනවා. එම නිසා පිංවත්නි සමාජය විසින් සම්මත කරන ලද කරුණු කාරණා පිළිපදිමින් ඒවාට අවනත වෙලා එම කරුණු කාරණා වලට අනුව ඔබගේ ජීවිකාව හැඩගස්වා ගතයුතු වෙනවා. එලෙස ජීවිකාව හැඩගස්වා ගත් විට ඔබගේ සිත කය වචනය තිදොරෙන් කිසිදු අයහපතක් පාප කර්මයක් සිදු වන්නේ නෑ. ඔබගේ  සිත කය වචනය යන තිදොර සම්පූර්ණයි පිංවත්නි. අන්න ඒ අවස්ථාවේදී ඔබට පුළුවන් යහපත් දහම් කාරණා මොනවාද, අයහපත් දහම් කාරණා මොනවාද කියල සහ ඔබගේ බුද්ධියෙන් වටහාගෙන ඊට අනුව ජීවිකාව හැඩ ගස්වා ගන්න.

ඉතිං පිංවත්නි අද දිනයේ මෙපමණ වේලාවක් ධර්මය ශ්‍රවණය කරලා ලබා ගත්තා වූ කුසලානිසංසයෙන් ඔබව ආරක්ෂා කර දෙන ඒ වගේම මෙම ස්ථානය ආරක්ෂා කර දෙන මේ ශාසනය ආරක්ෂා කර දෙන ඉෂ්ඨකාමී දෙවියන්ට මේ පිං හේතු වාසනා වේවා. ඒ දෙවියන් අවසන බලාපොරොත්තු වන්නා වූ අති උතුම් නිර්වාන ශක්තිය ලගා කර ගැනීමට මේ පිං හේතු වාසනා වේවා කියා සාධු කාරයක් පවත්වන්න. ඒ වගේම මෙපමණ වේලාවක්

“සබ්බ දානං ධම්ම දානං ජිනාති” කියන ආකාරයට සියලු දානයන් අතරින් උතුම් වූ ධර්ම දානය සිදු කරන්නට යෙදුනා. ඔබ මේ ධර්ම දේශනාව අවසානයේදී යම් කිසි දහම් කරුණු කාරණාවක් අවබෝධ කර ගත්තා නම් ඒ දහම් කරුණට අනුව ජීවිතය හැඩ ගස්වා ගනිමින් අප සියළු දෙනා අවසානයේ බෞද්ධයන් වශයෙන් බලාපොරොත්තු වන්නා වූ අති උතුම් නිර්වාණ සම්පත්තිය ළඟා කර ගැනීමට මේ කුසලානිසංසයන් හේතු වාසනා වේවා කියා සාධු කාරයක් පවත්වන්න.

ඒ වගේම ඔබගේ නමින් මිය පරලව ගිය ඥාතීන් අනන්තවත් ඇති. එම ඥාතීන් යම් කිසි දුගති ආත්මයක ඉපදී ඇත්නම් ඒ දුගති ආත්මයෙන් අත්මිදී සැපවත් ආත්ම ළඟා කර ගැනීමට මේ පිං හේතු වාසනා වේවා කියා සාධු කාරයක් පවත්වන්න. දෙවියන්ට පිං දීම සඳහා ඔහොමම වැද ගන්න.

දෙවියන් පිංදීම ...

පිරිකර පූජා කිරීම ...

සාධූ ! සාධූ ! සාධූ !

26.10.2017